# පිරිවෙන් ශබ්දයාගේ අර්ථ නිරූපණය

ලබුගම ලඞ්කානන්ද මහ නාහිමිපාණන් වහන්සේ

සියබසෙහි ද සාහිත්‍යයෙහි ද නොයෙක් තැනැ පැතිරැ සිටුනා 'පිරිවෙන්' සඳෙහි අර්ථාදි විභාග කල්පනය සඳහා හැකිතාක් සංක්‍ෂිප්ත කොට යථාර්ථය හෙළිවන පරිදි මේ ලිපිය සපයනු ලැබේ. විෂය මහත් වුව ද ලිපියට ලැබෙන ඉඩකඩ සැලැකීමෙනි. එළුයෙහි එන 'පිරිවෙන්' සද පෙලබසෙහි 'පරිවෙණ' ශබ්දය ප්‍රභව කොට ඇත්තේ යැ. සකුබසෙහි පරිවෙණ යන ව්‍යවහාරය අප්‍රකාශ යැ.

ශබ්ද ධර්මතා අනුවැ 'පරිවෙණ' යි මූර්ධන්‍ය ණකාරවත් ශබ්දයෙක් **වෙයි. එය සියබසට බිඳී එනුයේ 'පිරිවෙන්' යි දන්ත්‍ය නකාරවත්ව** යැ. **ශබ්දාන්තයෙහි** ස්වර රහිත ණකාරය නොයෙදෙන හෙයිනි. ඒ වූකලි ශබ්ද ධර්මතා යි. එහි ස්වරවත් රූපය 'පිරිවෙන' යි සිටියැ යුතු වෙයි. එහෙත් විද්‍යෝදය ගුරුකුලෙහි පඬිවරයෝ නැවත මූර්ධන්‍යාදෙශ කොට 'පිරිවෙණ' යයි ලියති. එහි සදසද්භාවය නිර්ණය කිරීමට ඡෙකප්‍රයොග විමසියැ යුතු වෙයි. (අනුරූ සේ පියෝනන්) සියබසෙහි මූලය ඡෙකප්‍රයොග වන හෙයිනි. මේ විමසන්න :

''විජයබා පිරුවන
කියන බණ මේ අසව් සතොසින''

මෙහි පාදන්ත එළියෙහි ලා 'ණ' කාරය නොසිටුනේ යැ. උච්චාරණයෙහි **දී ශ්‍රුතියෙන්** සමාන **බවක්** ඇසෙතත් ස්ථාන **කරණාදි** විසින් විභින්න වූ වර්ණ, දෙකෙකි. මෙසේ හෙයින් 'පිරිවෙන්, පිරිවෙන' ආදි තැන්හි දන්ත්‍ය නකාරවත් පද රූපය මැ සුශබ්ද සේ සලකන්නේ මැනැවි.

දෙසනා පාලියෙහි ද අට්ඨ **කථායෙහි** ද දක්නට ලැබෙන, එහෙත් සංස්කෘත සාහිත්‍යයෙහි සඳහන් නොලත් **'පරිවෙණ'** ශබ්දය කිසි තැනෙක බුද්ධ ශ්‍රාවක පැවිද්දන්ගේ වාසාගාරය කියයි : ''තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දාය භික්ඛුනියා පරිවෙණං උද්‍රියති'' එකල ථුල්ලනන්‍දා මෙහෙණගේ පිරිවෙන වැනැසෙයි, (උද්‍රියති-පරිවෙණං විනස්සති පරිපතතීති අත්‍ථො) පිරිවෙන බිඳ වැටෙයි යන අර්ථයි. මෙහි පිරිවන'යි වාසය කරන ගෘහයක් කියන ලදි.

තව ද ''භගවතො හි පරිනිබ්බානෙ සබ්බෙ භික්ඛූ අත්තනො අත්තනො පත්ත චීවරං ගහෙත්‍වා විහාරෙ ච පරිවෙණෙ ච **ඡඩ්ඩෙත්‍වා** අගමංසු'' (සමන්තපාසාදිකා 6 පිට) බුදුරදුන් පිරිනිවන් පෑ අවස්ථායෙහි සියලු වහන්දෑ තමන් තමන්ගේ පා සිවුරු ගෙන විහාරයන් ද පිරිවෙන් ද හැරපියා කුසිනාරාවට ගියාහු ය. මෙහි ද විහාර පිරිවෙන් දෙක මැ වාසාගාරයන් සඳහා කියන ලදි. ''විහාරො පි පරිවෙණම්පි ආවාසොපි විහාරොත්‍වෙව **සංඛං ගච්ඡති**'' විහාරයත් පිරිවෙනත් ආවාසයත් යන තුන මැ විහාර සංඛ්‍යාවට මැ යෙයි ; මෙහි ද විහාරයත් ආවාසයත් මෙන් ම පිරිවෙන ද භික්‍ෂූන්ගේ වාසාගාරයක් බව පවසයි.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - **www.oriental.lk**

විහාර පරිවෙණ දෙකෙහි වෙනසක් ද ඇත ; ''විහාරන්ති උපචාර සීමාසහිතං සකලං විහාරං'' උපචාර සීමාවත් සමග සියලු මැ විහාරය 'විහාර' නමැයි කියනු ලැබේ. මෙකල අස්ගිරි මල්වතු වැනි මහාවිහාරයෙකි. 'පරිවෙණන්ති මහා විහාරස්ස අබ්භන්තරෙ විසුං විසුං පාකාර පරිච්ඡින්නට්ඨානං (සාරත්ථ දීපනී) 'පරිවෙණ' නම් මහා විහාරය ඇතුළත වෙන වෙන මැ වැට පවුරු ආදියකින් පිරිසිඳුනා ලද වෙන් කරගත් තැනෙකි. ආවාසය එහි මැ මළුව ආදි විහාරාංග සියල්ල පරිවෙණ ශබ්දයෙන් කියන ලදි

බුදුරදුන් ජීවමාන සමයෙහි රජගහනුවර පමණක් මැ අටළොස් මහා විහාරයක් හා නොයෙක් පිරිවෙන් ද විය. තව ද මිහිඳු මහ රහතුන් වහන්සේ සඳහා දෙවනපැතිස් මහ රජු විසින් කාලප්‍රාසාද පිරිවෙන සුන්හාත පිරිවෙන දීඝචඞ්කමන පිරිවෙන ඵලග්ග පිරිවෙන මරුගණ පිරිවෙන යන පිරිවෙන් ද ඇමතියකු විසින් සිය නමින් දීඝසඳ සෙනෙවි නම් පිරිවෙනද කරවන ලද බව ඉතිහාසයෙහි සඳහන් වේ. මේ සියල්ල වාසාගාර බව පෙනේ.

යළිදු ''පරිවෙණං සම්මජ්ජිත්වාති - සචෙ පාතො සම්මට්ඨං අසම්මට්ඨම්පිවා තිණපණ්ණාදීහි උක්ලාපං පාදප්පහාරෙහි විකිණ්ණ වාලිකං ජාතං සමමජ්ජිතබ්බං (විනය අටුවා 579 පිට) උදෑසන හමදනා ලද හෝ නො හමදනා ලද හෝ නමුදු තණ පරණලා ආදි කැලි කසළින් කිලිටිවූයේ හෝ පා පහරින් විසුරුණු වැලි ඇති යේ හෝ වී නම් මළුව හැමැන්දයුතුය. හුදෙක් මෙහි විහාරස්ථානයක අංගණය – මළුව මතුයෙක් 'පරිවෙණ' යයි කියන ලද බව පෙනේ.

අලුවිහාරයෙහි පැවැති ලේඛන සංඞ්ගීතිය දක්වා සියවස් සතරක් පමණ කාලයෙහි ත්‍රිපිටකධාරී මහ තෙරවරු සියලු ධර්මාභිධර්මවිනය යන දහම් කොටස් සිය අතැවැසියනට මුඛ පාඨයෙන් මැ පුහුණු කැරවූහ. මේ සඳහා දීඝභාණකාදි ආචාර්‍ය්‍යවරයනට නිවාස වූ ස්ථානය 'පරිවෙණ' නම් විය. පිරිසිඳීම් වශයෙන් වෙන් කොට ගන්නා ලද හෙයිනි. (පරිච්ඡෙදවසෙන වෙදියති දිස්සතීති පරිවෙණං -සාරත්ථදීපනී) මුල්යුගයෙහි තෙවළා දහම් ඉගැන්වීම සඳහා මැ පැවැති පිරිවෙන් වල ආචාර්‍ය්‍යවරයෝ ගිහි අතැවැසියනට තමන් දන්නා අන්‍යත් විෂයයනු දු ඉගැන්වීම ආරම්භ කළහ. ගිහි පැවිදි දෙපක්ෂයේ මැ අධ්‍යාපන මධ්‍යස්ථානය විහාරස්ථානය මැ වූ හෙයින් විවිධ විෂයයන් පිළිබඳ දැනුම් ඇති පැවිදි ආචාර්‍ය්‍යවරයන් වෙත ගිහි පැවිදි දෙපක්ෂයෙහි මැ අතැවැසියෝ තමන් තමන්ට අභිමත වූ විෂයයන් හදාරන්නට පටන් ගත්හ. මෙසේ ආරම්භයෙහි 'පරිවෙණ' නාමයෙන් පැවැති පැවිද්දන්ගේ ආරාමය අධ්‍යාපන ආයතනයක් වශයෙන් රූඪ විය.

කල් යත් යත්මැ මහා විහාරයෙන් පරිබාහිර වැ ද පිරිවෙන ගොඩනැගෙන්නට විය. සේරිස්සක නම් දිව්‍ය පුත්‍රයාගෙන් ලද පිහිට ඇති වැ පෙරලා සිය රට පැමිණි අංග මගධ දෙරට වැසි වෙළෙන්දෝ ඒ දිව්‍ය පුත්‍රයාට උපහාර පිණිස පැළලුප් නුවර සේරිස්සක නම් පිරිවෙනක් කැරවූහ. (සෙරිස්සකං තෙ පරිවෙණං කාරයිංසු - විමානවත්ථු) මේ පිරිවෙන මහා විහාරයක් ඇතුළත නො වී ය. පවුරකින් පිරිකෙව් කළ හෙයින් 'පරිවෙණ' නම් විය. එ ද ප්‍රාසාද කූටාගාර රාත්‍රිස්ථාන දිවාස්ථානාදියෙන් පරිපූර්ණ විය. (පරිච්ඡෙදවසෙන වෙදිතබ්බතො පෙක්ඛි-

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

තබ්බතො පරිවෙණං පාසාද කූටාගාර රත්තිට්ඨානාදී සම්පන්නං පාකාර පරිච්ඡින්නං ද්වාර කොට්ඨක යුත්තං ආවාසං අකංසු - පරමත්ථදීපනී) මේ පිරිවෙන ගොඩ නැඟුනේ බුදුන් පිරිනිවි අවුරුදු සියයකින් පසුව ය. සෙරිස්සක විමාන කථාව දෙවැනි සංගීතියෙහිලා සංගිත විය. මිලින්ද-පඤ්හයෙහි සාගල නුවර නාගසෙන තෙරුන් වැඩසිටි සංඛෙය්‍ය පිරිවෙන ද මහා විහාරයකින් බාහිර වැ ගොඩනගන ලද්දෙකි.

නව ද අනුරාධපුර මහමෙවුනා උයන සඟ සතු කොට පුදන ලදු·වැ මහා විහාරය බවට පරිවර්තනය වූ පසු මිහිඳු මහරහතුන් වහන්සේ සඳහා දෙවනපෑතිස් මහරජු විසින් කාලප්‍රාසාද පිරිවෙන සුන්හාත පිරිවෙන දීඝචංකමන පිරිවෙන ඵලග්ග පිරිවෙන හා මරුගණ පිරිවෙන ද, ඇමතියකු විසින් සිය නමින් දික්සඳ සෙනෙවි පිරිවෙන ද කරවන ලදැයි ඉතිහාසයෙහිසඳහන් වේ. මේ පිරිවෙනුද යට දැක්වූ බුද්ධකාලීන පිරිවෙන් හා සමාන ලෙස සිතියැ හෙයි. මේ පිරිවෙන් බොහෝ කලක් මහා විහාරීය මහතෙරවරුන්ට ආවාස ද විය. ධාතුසේන රජ කුමාරකාලයෙහි පැවිදි ව සිටියේ මෙහි ය. මහානාම තෙරණුවන් මහාවංශයෙහි ප්‍රථමභාගය රචනාකරන ලද්දේ මෙහිදී මැ ය. පසු කාලයෙහි මහා විහාරය ඇසුරුකොට බොහෝ පිරිවෙන් ඇති විය. දුටුගැමුණු සමයෙහි සොණුත්තර තෙරුන් වැඩ සිටි පුද පිරිවෙන හා කට්ඨහාල නම් පිරිවෙනක් ද බුද්ධදාස රජතුමා පස්විසිරියන් මහා ප්‍රාසාදයක් සහිත මයූර පිරිවෙන ද බුදුගොස් මහතෙරුන් හෙළටුවා පෙලබසට නගාලූ දූරසඞ්කර ග්‍රන්ථාකර පිරිවෙන ද මුගලන් රජු විසින් කරවන ලද ඡත්තවඩ්ඩී නම් පිරිවෙන ද යනාදි බොහෝ පිරිවෙන් මහා විහාරය තුළ ගොඩනැඟුණු බව කියැ යුතු වෙයි.

පසු කාලයෙහි මහාවිහාරයෙන් බාහිරව ද බොහෝ පෙදෙස් වල සිය ගණ-නින් පිරිවෙන් ගොඩ නැඟුණු සැටි ඉතිහාසයෙන් හා ග්‍රන්ථාන්තරයෙන් දත හෙයි. වළගම්බා රජු අභයගිරි විහාරය කරවන ලද්දේ පිරිවෙන් දෙළසෙකින් යුක්තව යැ. කණිටුතිස් රජු අභයගිරි, මණිසෝම යන විහාර දෙක්හි පිරිවෙන් දෙකක් ද දෙවැනි දයොපතිස්ස රජු අභයගිරියෙහි ම කපුරු පිරිවෙන ද මානවම්ම රජු උතුරොල නම් පිරිවෙනක් ද කරවන ලද්දේ ය. සතරවෙනි අග්බෝ රජුගේ කාලය වන විට දිව-යිනේ ඒ ඒ තැන මාණ්ඩලිකයෝ තම තමන්ගේ ශක්ති පරිදි බොහෝ විහාර ද පිරිවෙන් ද කැරවූහ.

> ''දීපෙ මණ්ඩලිකා සබ්බෙ - තත්‍ථ තත්‍ථ යථාබලං
> විහාරෙ පරිවෙණෙච - කාරයිංසු අනප්පකෙ''

(මහාවංස 44-31)

අනුරාධපුර රාජධානිය වැටීමෙන් පසු ඇති වූ ද්‍රවිඩ ආක්‍රමණ නිසා රටේ පිරිහීමත් සමග බොහෝ පිරිවෙන් ද වැනැසී ගිය බව කියැ යුතු යැ. නැවත පොළොන්නරු-යෙහි මහ පැරකුම්බා රජු විසින් ජේතවන මහාවිහාරය ගොඩ නඟා එහි දීර්ඝ ප්‍රාසාද සහිත දෙමහල් පිරිවෙන් පන්සැත්තෑවක් කරවන ලද්දේ ය. එ රජු විසින් ම අතිශයින් වර්ණනීය වූ ආදහන පිරිවෙන ද කරවන ලදි. අනතුරු ව දඹදෙණි කුරුණෑගල ජයවර්ධනපුර ආදි රාජධානි සමයෙහි රජ ඇමති ආදීන් විසින් ඒ ඒ රාජධානිවල ද රුහුණු ආදී ජනපදයන්හි ද පිරිවෙන් ගොඩ නැඟූ සැටි ඉතිහාසයෙන් හා ග්‍රන්ථාන්තරයෙන් ද දක්නට ලැබේ. පූජාවලිය ලියූ බුද්ධපුත්‍ර මහතෙරුන් විසූ

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

මයුරපාද පිරිවෙන ප්‍රකට වූවකි. බෙලිගල භුවනෙකබා පිරිවෙන දඹදෙණි කුරුණෑගල ආදී රාජධානිවල ගොඩ නැඟුණු පිරිවෙන් ද මෙහි ලා සැලකිය යුතු වේ.

පිරිවෙන ලක්දිවැ සමස්ත අධ්‍යාපන නිකේතනය බවට පැමිණි හෙයින් එහි සංරක්ෂණය සඳහා සියලු විධි විධාන යොදන ලද්දේ ය. ආයතන පදවි පිරිවෙන් පදවි ආදිය ද කාලානුරූප විෂය මාලා ද නියමිත විය. මූලික අධ්‍යාපනය විහාරස්ථානයෙන් ලැබුණු අනර උසස් අධ්‍යාපනය සඳහා පිරිවෙන විවෘත විය. තවද පිරිවෙන් නාමයෙන් එහි අධිපතියා ද හඳුන්වා ලූ තැන් ඇත. ''විජයබා පිරුවන කියන බණ'' ''පතිරජ පිරුවනගෙ සිතද'' යනාදිය විමසන්නෝ මැනැවි.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk